**මාධ්‍ය ප්‍රමිතිය සහ ග්‍රාහක අයිතීන් සුරක්ෂිත කිරීමට ආයතනික රාමුවක් සකස් කිරීම සඳහා මහජනතාව විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාවල සංක්ෂිප්තය.**

**පසුබිම :**

ජනමාධ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමේ ලේකම් කාර්යාලය විසින් යුනෙස්කෝ මාධ්‍ය සංවර්ධන දර්ශක පදනම් කරගෙන, ශ්‍රී ලංකාවේ මාධ්‍ය කර්මාන්තය පිළිබඳව කරනු ලැබූ තක්සේරුවට අනුව 2016 මැයි මස 03 වැනි දින කොළඹදී එළිදැක්වුණු වාර්තාවේ නිර්දේශ මත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් 2016 නොවැම්බර් මාසයේදී ජනමාධ්‍ය අයිතීන් සහ ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට මහජනතාවට විවෘත ආරාධනා කරනු ලැබීය. (ඇමුනුම 2) මේ සඳහා මාස 3ක කාල සීමාවක් ලබාදී තිබිණි. එම ආරාධනාවට මහජනතාව, මහජන සංවිධාන, මාධ්‍යවේදීන්ගේ සංවිධාන පුළුල් ප්‍රතිචාරයක් දක්වනු ලැබීය. ඒ අනුව මහජනතාව විසින් ලිඛිතව එවනු ලැබූ යෝජනා සංස්කරණයෙන් තොරව සංක්ෂිප්තව පහත දක්වා තිබේ.

01. මාධ්‍ය නිදහස පිළිගෙන සුරක්ෂිත කිරීම සඳහා මාධ්‍ය අන්තර්ගතය උසස් ප්‍රමිතියෙන් සහ වෘත්තීයභාවයෙන් සකස් කිරීමට මාධ්‍ය ආයතන පෙළඹවීම සඳහා යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

02. ජනමාධ්‍යවේදී වෘත්තීය සඳහා ප්‍රවේශවීමට අවම සුදුසුකම් නිර්දේශ කිරීමට සහ ඔවුන්ගේ වෘත්තීය භාවය ආරක්ෂා කිරීමට ස්වාධීන ආයතනය ව්‍යුහයක් තිබිය යුතු ය.

03. නිවැරදි තොරතුරු මුලාශ්‍රවලින් නිවැරදි සහ සත්‍ය තොරතුරු පමණක් ලබා ගැනීම වගබලා ගැනීමට සහ මුලාශ්‍රවලින් තොරව ගෙතන ලද හෝ අතිශෝක්තියට නඟන ලද, විකෘති කරන ලද තොරතුරු ජනමාධය විසින් ඉදිරිපත් කිරීම වැළැක්වීමට පියවර ගැනීම අවශ්‍ය වේ.

04. ජනමාධ්‍යවේදීන්ගේ නිල රාජකාරිවලට බාධා පමුණුවන පුද්ගලයන්ට සහ ආයතනවලට එරෙහිව නීත්‍යානුකූල පියවර ගත හැකි තත්ත්වයක් සකස් කළ යුතු ය.

05. මහජනතාවට දැනුවත් තීරණ ගැනීම සඳහා සමාජයේ විවිධ තොරතුරු සහ විවිධ මත දැන ගැනීම සහතික කළ යුතු ය.

06. මහජනතාවට උපරිම තෝරා ගැනීමක් කිරීමට අවස්ථාව ලැබෙන පරිදි මාධ්‍ය ආයතන වපසරිය පුළුල් කළ යුතු ය.

07. ජනමාධ්‍ය, පක්ෂග්‍රාහිව, ද්වේශය, වෛරය පැතිරවීම, ආවේගශීලි සහ සංවේගශීලී ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම වැළැක්විය යුතු ය.

08. මාධ්‍යවේදීන් සඳහා පොදු ආචාරධර්ම පද්ධතියක් සකස්කර ඒවා පිළිපදින්නේ ද යන්න සොයා බැලීමට ස්වාධීන ආයතන ව්‍යුහයක් පිහිටු විය යුතු ය. ඒ සඳහා සහභාගි වීමට මහජනතාවට ද අවස්ථාව ලබාදිය යුතු ය.

09. ජනමාධ්‍ය මහජන සේවයක් වශයෙන් මහජන වුවමනාවන්, අවශ්‍යතාවන් සහ මහජනතාවට බලපාන කරුණු ආවරණය කරනු වෙනුවට එම මාධ්‍ය ආයතන ප්‍රවර්ධනය සහ එම ආයතනවල න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරනු දක්නට ලැබේ. එය වැළැක්වීමට පියවර ගැනීම අවශ්‍ය වේ.

10. ව්‍යාපාරිකයින්ට, බාහිර පුද්ගලයන්ට සහ ආයතනවලට ජනමාධ්‍ය අන්තර්ගතය තීරණය කිරීමට මැදිහත් වීමට නොහැකි වන ආකාරයට නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

11. විද්‍යුත් මාධ්‍ය විසින් ප්‍රචාරය කරනු ලබන අරුත්සුන්, අභව්‍ය, යථාර්තවාදී නොවන වැඩසටහන් සහ ආයතනික වැඩසටහන් පිළිබඳව පාලනයක් ඇති කළ යුතු ය.

12. සාමාජ වෙබ් අඩවි අන්තර්ගතය සහ ක්‍රියාකාරිත්වය විනයකට යටත් කළ යුතු ය.

13. සාමාන්‍ය පාඨකයින් පුවත්පත්වලට සපයන ලිපිවලට පුළුල් අවධානයක් සහ පිළිගැනීමක් ලබාදිය යුතු ය.

14. ජනමාධ්‍ය ප්‍රමිතිය අධීක්ෂණයට පත් කරන ආයතනය ස්වාධීන විය යුතු ය. එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වන පුද්ගලයන්ගේ සුදුසුකම්, පත්වන ආකාරය, බලතල ඉවත් වන ආකාරය පැහැදිලිව සඳහන් වී තිබිය යුතු ය.

15. පිළිගත් ජනමාධ්‍ය ආචාරධර්ම උල්ලංඝනය කිරීම ප්‍රතික්ෂේප කරන මාධ්‍යවේදීන් සහ කර්තෘවරුන්ට දඬුවම් පැමිණවීම සහ සේවයෙන් පහ කිරීම නීති විරෝධී ක්‍රියාවක් වශයෙන් සැලකිය යුතු ය.

16. ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ තොරතුරු මුලාශ්‍ර හෙළිදරව් කිරීම වැළැක්වීමට නීතිමය රාමුවක් සකස් කළ යුතු ය.

17. මාධ්‍ය ආයතන සමාජයට වග වන තත්ත්වයක් සහ ඒ සඳහා ආයතන ව්‍යුහයක් අවශ්‍ය වේ.

18. ජනමාධ්‍ය ආචාර්ධර්ම වෘත්තීය භාවය ආරක්ෂා කිරීමට ජනමාධ්‍ය ස්වයං විවේචන සහ ස්වයං විවේචන යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතු ය.

19. යෝජිත මාධ්‍ය ස්වයං නියාමන ආයතනය මඟින් මාධ්‍ය හිමිකරුවන් බාහිර ආයතන බාහිර සංවිධාන, පුද්ගලයන් මාධ්‍යවේදීන්ට සහ සංස්කාරවරුන්ට කරනු ලබන බලපෑම් වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

20. මාධ්‍යවේදින්ට සිදු කරනු ලබන සියලුම ආකාරයේ මානසික සහ කායික හිංසනයන් වැළැක්වීමට පියවර ගත යුතු ය.

21. මාධ්‍ය විසින් සමාජය පොදුවේ පිළිගන්නා විශ්වීය වටිනාකම් සහ සාරධර්ම උල්ලංඝනය කිරීම වැළැක්වීමට යෝජිත නියාමන ආයතනය පියවර ගත යුතු ය.

22. රාජ්‍ය හිමිකාරිත්වය සහිත මාධ්‍ය රාජ්‍ය හිමිකාරත්වයෙන් ඉවත් කර මහජන සේවා මාධ්‍ය බවට පත් කළ යුතු ය.

23. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය අහෝසි කළ යුතු ය.

24. පුවත්පත් පැමිණිලි කොමිෂමේ අරමුණු ශක්තිමත් කිරීමට පියවර ගත යුතු ය.

25. මාධ්‍ය ස්වයං නියාමන යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතු ය.

26. මාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සියලුම මාධ්‍ය ආයතනවල වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයට ඉඩ සැලසෙන නීතිමය වටපිටාවක් සැකසිය යුතු ය.

27. මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය සහ වෙබ් මාධ්‍ය ආවරණය වන පරිදි ලෝක ආදර්ශයක් සමඟ අනන්‍ය වූ මාධ්‍ය ආචාර්ධර්ම සහ නීති පද්ධතියක් හඳුන්වා දිය යුතු ය.

28. මාධ්‍ය ආයතන හිමිකරුවන්ට, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සහ මාධ්‍යවෙදීන්ට දේශපාලන සංවිධානවල ක්‍රියාකාරින් වීමට තිබෙන අවස්ථා අහිමිකළ යුතු ය.

29. මාධ්‍ය ආයතනවල භූමිකාව මාධ්‍ය ක්ෂේත්‍රයට පමණක් සීමා කළ යුතු ය.

30. මාධ්‍ය නියාමන සඳහා නීතිමය යාන්ත්‍රණයක් නොව ස්වයං නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු ය.

31. මහජනතාව මාධ්‍ය ප්‍රමිතිය පිළිබඳව දක්වන ප්‍රතිචාර විධිමත් ලෙස ලබා ගන්නේ මාධ්‍ය ශ්‍රේණිගතකර (ranking) වරින් වර ප්‍රසිද්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසිය යුතු.

32. මාධ්‍ය අන්තර්ගතය, මාධ්‍ය ආචාර්ධර්ම භාවිතය ඔස්සේ නිරීක්ෂණයකර එම වාර්තාව මාස 3කට වරක් මහජනතාවට ප්‍රසිද්ධ කිරීමේ ව්‍යුහයක් සකස් කළ යුතු ය.

33. මාධ්‍ය ස්වයං නියාමනයට පිහිටුවනු ලබන ආයතනය මුළුමනින්ම ස්වාධීන බවට පත් කිරීමට හැකි සෑම පියවරක්ම ගත යුතු ය.

34. මාධ්‍ය ස්වයං නියාමන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම, ඉවත් කිරීම පිළිබඳ විධිවිධාන මාධ්‍ය නිදහස සුරක්ෂිත කිරීම උපරිම වශයෙන් තහවුරු කිරීම අරමුණු කරගෙන සිදු කළ යුතු ය.

35. මාධ්‍ය ස්වයං නියාමන ආයතනයේ ප්‍රධානියා වශයෙන් විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු පත් කිරීම වඩාත් සුදුසු වේ.

36. සමාජයේ සියලු කොටස්වලට අදහස්, තොරතුරු, මත ඉදිරිපත් කිරීමට සමාන අවස්ථාවක් ලැබෙන පරිදි සහ ඔවුන්ගේ වුවමනාවන් ඉටු වන පරිදි සමස්ත මාධ්‍ය කර්මාන්තයම ප්‍රතිසංස්කරණය කළ යුතු ය.

37. මාධ්‍යවේදීන්ට, මාධ්‍ය ආයතනය වෙනුවෙන් වැඩසටහන් ඉදිරිපත් කරන්නන්ට වෙළෙඳ දැන්වීම ප්‍රචාරකයන් ලෙස කටයුතු කිරීමට ඉඩ නොදිය යුතු ය.

38. මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ ව්‍යාපාරික කටයුතු සහ දේශපාලන ක්‍රියාකාරකම් විමර්ශනය කර ප්‍රසිද්ධ කිරීම සඳහා ආයතන ව්‍යුහයක් අවශ්‍ය වේ.

39. ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය හේතුවෙන් අපකීර්තියට, හිංසනයට සහ පීඩනයට පත්වන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂාකරදීම සඳහා ආයතන ව්‍යුහයක් අවශ්‍ය වේ.

40. 1998 සහ 2008 කොළඹ ප්‍රකාශන පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ මාධ්‍ය කර්මාන්තය ප්‍රතිසංස්කරණය කළ යුතු ය.

41. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ තිබෙන ආචාරධර්ම පද්ධතිය සියලුම විද්‍යුත් මාධ්‍යයන්ට අදාළව ක්‍රියාත්මක කළ යුතු ය.

42. මාධ්‍ය විසින් කරනු ලබන ආචාර්ධර්මීය නොවන ආවරණයන් කෙරෙහි ස්වයං නියාමනයේදී අවධානය යොමු කළ යුතු වුවත් විවරණ/විචාරශිලී ආවරණයන් එමඟින් නොවැළැක්විය යුතු ය.

43. මෙරට මාධ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා වරින් වර කරනු ලැබූ අධ්‍යයන සහ ඒවායේ වාර්තාවල නිර්දේශ කෙරෙහි මාධ්‍ය නියාමන යාන්ත්‍රණයක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු ය.

44. මාධ්‍ය ප්‍රමිතිගත කිරීම ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක කොටසක් විය යුතු ය.

45. යහපත් මාධ්‍ය සංස්කෘතියක් පවත්වා ගෙන යාම සඳහා ස්වාධීන විකාශණ අධිකාරියක් පිහිට විය යුතු ය.

46. රාජ්‍ය, පෞද්ගලික මෙන්ම වීඩියෝ නිෂ්පාදකයන්ද, සමාජීය මාධ්‍යන්ටද මාධ්‍ය ආචාරධර්ම අදාළ කර ඒවා උල්ලංඝනයට විරුද්ධව නීත්‍යනුකූල පියවර ගැනීමේ අවස්ථාව ලබාදිය යුතු ය.

47. සමාජයේ තිබෙන විවිධත්වය සහ රසඥතාවය ප්‍රවර්ධනය වන පරිදි සහ දැනුවත් පුරවැසියකු බිහි කිරීම අරමුණු කරගත් මාධ්‍ය නියාමන යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

48. ඉන්දියාවේ සහ බ්‍රිතාන්‍යයේ අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් සියලුම වෙළෙඳ දැන්වීම්වල ප්‍රමිතිය සහ ආචාර් ධර්මීය බව ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳ දැන්වීම් ප්‍රමිති අධිකරියක් පිහිටුවිය යුතු ය.

49. මාධ්‍ය යනු බලයට, ආරක්ෂාවට, පැවැත්මට මඟක් නිසා සමස්තයට දෙන විසඳුමක් නොවන මාධ්‍ය පාලනය එන ඕනෑම හුදෙකලා උත්සාහයක් යම් පටු අරමුණක් වෙනුවෙන් කෙරෙන මාධ්‍ය මර්දනයක් ලෙස හඳුන්වාදීමට ඉඩ තිබෙන බැවින් මාධ්‍ය ප්‍රතිසංස්කරණයේ දී ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

50. මාධ්‍ය නියාමන යාන්ත්‍රණයක් තුළ මාධ්‍ය නිදහසට බාධාවන විධිවිධාන ඇතුළත් නොවිය යුතු ය. දැනට රජය වරින්වර ප්‍රකාශ කර තිබෙන අදහස් අනුව සහ සකස් කර තිබෙන කොටුම්පතේ ඇතැම් විධවිධාන අනුව එසේ සිදු වීමේ ඉඟි දක්නට ලැබේ.

51. මාධ්‍ය ස්වයං නියාමන යාන්ත්‍රණය රජය පොරොන්දු වී ඇති විවෘත භාවය, සිය රාජ්‍ය පාලනය, නිදහස සුරක්ෂිත කිරීම ආදී කරුණු මත පදනම් විය යුතු ය.

52. මාධ්‍ය, දැනුවත් පුරවැසි සමාජයක් බිහි කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වන ආකාරයට රාමුගත කිරීම කළ යුතුය. එය රජයේ හෝ යම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ හඬ බවට පමණක් පත් නොවිය යුතුය.

53. තොරතුරු සහ සිදුවීම් අතිශෝක්තියට ලක් කර, සංවේදිකරණයක් සහිත නාට්‍ය බවට පත් කර ප්‍රචාරය කිරීම වැළැක්විය යුතු ය.

54. ජනමාධ්‍ය මඟින් නිශේධනාත්මක තොරතුරු, අදහස්, ආකල්ප ප්‍රචාරය කිරීම වැළැක්විය යුතු ය.

55. ජනමාධ්‍යවේදීන් තමන් සේවය කරනු ලබන මාධ්‍ය ආයතනයේ හිමිකරුවාට සහ ඔහුගේ න්‍යාය පත්‍රයට සේවය කරනු වෙනුවට මහජනතාවට වග කියන වෘත්තිකයන් බවට පත් කිරීමට නීතිමය ව්‍යුහයක් අවශ්‍ය වේ.

56. ජනමාධ්‍ය ආචාරධර්ම පිළිපැදීම නීත්‍යානුකූල කිරීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

57. මාධ්‍ය අන්තර්ගතය නිරීක්ෂණය සඳහා ස්වාධීන ආයතන ව්‍යුහයක් අවශ්‍ය වේ.

58. වැඩසටහන් ප්‍රචාරය වන අතරතුර ග්‍රාහක රසවින්දනයට බාධාවන ලෙස වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය කිරීම වැළැක්වීමට නීතිමය නියාමනයක් අවශ්‍ය වේ.

59. නව සරල තාක්ෂණය භාවිතයට සහ මාධ්‍ය අන්තර්ගතයට සහභාගි වීමට ඕනෑම පුරවැසියකුට අවස්ථාවක් ලැබී තිබෙන බැවින් ඔවුන් වෙතින් සමාජයට සහ පුද්ගලයන්ට සිදුවන හානිය, දැනට තිබෙන ආචාරධර්ම සහ ආයතන මඟින් වැළැක්විය නොහැකිය. ඒ සඳහා නව ආරක මාධ්‍ය ආචාරධර්ම සහ ආයතන ව්‍යුහයක් පිහිටු විය යුතු ය.

60. ජනමාධ්‍ය විසින් මහජනතාවට සිදු කරනු ලබන අකටයුතුකම්, අසාධාරණකම්, අපහාස කිරීම්, සහ මාධ්‍ය බලය අයථා ලෙස භාවිතය ආදිය වැළැක්වීමට නීතිමය බලය සහිත ස්වාධීන ආයතනයක් පිහිටවිය යුතු ය.

61. ජනමාධ්‍යවල සමාජ වගකීම සහ වගවීම සහතික කිරීම සඳහා ස්වාධීන බලය සහිත ආයතනයක් අවශ්‍ය වේ.

62. වැඩසටහන් ප්‍රචාරය වන අතරතුර එයට බාධාවන ලෙස වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය කිරීම සහ වේලාව සඳහන් කිරීම ග්‍රාහකයින්ගේ අයිතීන් උල්ලංඝණය කිරීමක් බැවින් එය වැළැක්වීමට පියවර ගත යුතුයි.

63. වාර්ගික සහයෝගිතාවය සඳහා විවිධ භාෂාවන්ගෙන් ප්‍රචාරය වන වැඩසටහන් අනෙකුත් භාෂාවන්ට පරිවර්තනය කර ප්‍රචාරය කළ යුතු ය.

64. ජනමාධ්‍ය සමාජයේ මුර බල්ලාගේ භූමිකාව නිවරදිව ඉටු කරන්නේ ද යන්න නිරීක්ෂණය කිරීමට ආයතනයක් අවශ්‍ය වේ.

65. විද්‍යුත් මාධ්‍යවල භාවිත වන භාෂාව ඉතා දුර්වල තත්ත්වයක පවතී. වඩා ප්‍රශස්ත භාෂා භාවිතයක් කෙරෙහි එම නාලිකා යොමු කිරීම අවශ්‍ය වේ.

66. රාජ්‍ය හිමිකාරත්වය සහිත මාධ්‍ය ඇතුළු සියලු මාධ්‍ය අන්තර්ගතය විශ්ලේෂණය කර ඒවායේ වෘත්තීය භාවිතය පිළිබඳව වාර්තාවක් වරින් වර නිකුත් කිරීමට පියවර ගත යුතු ය.

67. ජනමාධ්‍යවේදීන්ට තම පෞද්ගලික න්‍යාය පත්‍රයට හෝ හිමිකරුගේ න්‍යාය පත්‍රයට අනුව මාධ්‍ය අන්තර්ගතය සකස් කිරීමට තිබෙන ඉඩ ප්‍රස්ථා වැළැක්වීමට පියවර ගත යුතු ය.

68. මාධ්‍ය ආයතන පවත්වා ගෙන යාමට බාහිර සංවිධානවලට ඉඩ නොතිබිය යුතු අතර අයථා ලෙස උපයා ගත් මුදල් මාධ්‍ය ආයතන ආරම්භ කිරීමට සහ පවත්වා ගෙන යාමට යෙදවීම වැළැක්වීමට පියවර ගත යුතු ය.

69. මාධ්‍යවේදීන්ට ත්‍යාග සහ වරප්‍රසාද ලබා ගැනීමට තිබෙන ඉඩ ප්‍රස්ථා අවහිර කළ යුතු ය.

70. රාජ්‍ය හිමිකාරිත්වය සහිත ජනමාධ්‍ය ආණ්ඩුවේ පාලනයෙන් සහ බලපෑමෙන් නිදහස් කිරීමට පියවර ගත යුතුය.

71. ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට වෘත්තීය පිළිගැනීමක් සහ වෘත්තීය පහසුකම් සැලසිය යුතු ය.

72. සමාජයට පුර්වාදර්ශයක් වියහැකි සිය දිවි නසා ගැනීම්, ස්ත්‍රී දූෂණ, අපරාධ ආදිය ජනමාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීම තහනම් කළ යුතු ය.

73. වයස අවුරුදු 18ට අඩු පිරිස වෙළෙඳ දැන්වීම් සහ වෙළෙඳ ප්‍රචාරය සඳහා යොදා ගැනීම තහනම් කළ යුතු ය.

74. සියලුම මාධ්‍යවලින් ප්‍රචාරය වන සහ පළ කරන දෑ බුද්ධි මණ්ඩලයක අධීක්ෂණයට යටත් කළ යුතු ය.

75. ජනමාධ්‍ය නියාමන ආයතනයක් පිහිටවිය යුතු ය. එම ආයතනයට ජනමාධ්‍ය ආයතනවල අභිමතාර්ථ සහ ඒවාට ප්‍රාග්ධනය සපයන ආකාරය පරීක්ෂා කිරීම, වෘත්තීය නිදහස පරීක්ෂා කිරීම, ආචාර්ය ධර්ම පද්ධතියක් සැකසීම, ජනමාධ්‍ය ශ්‍රේණිගත කිරීම ආදී කාර්යයන් පැවරිය යුතු ය.

76. ජාතිවාදී, ආගම්වාදී පුවත් නිර්මාණයට සහ ප්‍රචාරයට සීමා පැනවිය යුතු ය.

77. ව්‍යාජ තොරතුරු මත පදනම්ව පුද්ගල කීර්තියට ජනමාධ්‍ය මඟින් හානි පැමිණවීම වැළැක්වීමට පියවර ගත යුතු ය.

78. වාණිජ පරමාර්ථයෙන් තොර වැඩසටහන් ප්‍රචාරය දිරිමත් කළ යුතු ය.

79. මාධ්‍යවේදීන්ට මාධ්‍ය වෘත්තීය සහ රට අතහැර යාම වැළැක්වීමට පියවරගත යුතු අතර සමාජයේ ගෞරවනීය පුද්ගලයන් මාධ්‍ය අන්තර්ගතය නිර්මාණය කිරීමට සහභාගි කර ගැනීමට පියවර ගත යුතුය.

80.** සුනන්ද දේශප්‍රිය මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා මඟින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ සංකල්ප පත්‍රිකාවට ඍජුව ප්‍රතිචාර දක්වා ඇති බැවින් එය මෙහි ඇමුණුම 2 වශයෙන් ඉදිරිපත් කර ඇත.

**අදහස් සහ යෝජනා ලිඛිතව ඉදිරිපත් කළ ආයතය :**

01. මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය

02. මාධ්‍ය ආචාරධර්ම සහ සමාජ සාධාරණය උදෙසා වූ මාධ්‍යවේදීන්ගේ ව්‍යාපාරය

03. වෙරිටේ රිසර්ච්

04. ශ්‍රී ලංකා බ්‍රීෆ්

05. නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය

06. ශ්‍රී ලංක පුවත්පත් ආයතනය

07. ශ්‍රී ලංකා පුවත්පත් සමාජය

08. කර්තෘ සංසදය

09. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

10. ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය

11. Tamil Media Forum

12. Muslim Media Forum

13. Fridrich Ebert Stiftung

14. Groundviews

15. Lirneasiai.net

16. නිදහස උදෙසා මාධ්‍යවේදියෝ

17. Kilakku Vaan Network Media

18. Sri Lanka Green World Organization

19. කැලණි අධ්‍යයන කවය

20. Saththam FM

21. The Salvation Army Sri Lanka Territory

22. තුරුණු සවිය මිතුරු සංසදය - ගොඩකවෙල

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ
2017 මැයි 05